සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 8 - ශ්‍රේණිය

## පුරවැසි අධ්‍යාපනය පිළිතුරු

I කොටස

| | | | |
|---|---|---|---|
| (01) 4 | (06) 3 | (11) | (16) පරිසරය හා ස්වාභාවික සම්පත් |
| (02) 2 | (07) 2 | (12) | (17) තිරසර |
| (03) 4 | (08) 2 | (13) | (18) ඉංග්‍රීසි |
| (04) 3 | (09) 1 | (14) | (19) සංවහන |
| (05) 1 | (10) 4 | (15) | (20) අවුරුදු 18 |

(ලකුණු 2×20=40)

II කොටස

(01)
(1) පරිසර අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී දෙපාර්තමේන්තුව, භූ විද්‍යා හා පතල් කාර්යාංශය, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
(2) අන් අයගේ මතයට ගරු කිරීම, සහයෝගයෙන් කටයුතු කිරීම, විනිවිදභාවයෙන් කටයුතු කිරීම, විවිධ මත ඉවසීම, සමානාත්මතාව ගරු කිරීම ආදී
(3) මුඛ ආවරණ පැළඳීම, නිතර දෑත් පිරිසිදු කිරීම, සෞඛ්‍ය උපදෙස් හා නීති රීති පිළිපැදීම ආදිය
(4) බෞද්ධ සංස්කෘතිය, හින්දු සංස්කෘතිය, ඉස්ලාම් සංස්කෘතිය, ක්‍රිස්තියානි සංස්කෘතිය
(5) රාජ්‍ය අංශය හා අර්ධ රාජ්‍ය අංශය , පෞද්ගලික අංශය , ස්වයං රැකියා
(6) වන ආවරණ ඉවත් නොකිරීම, ගස්වැල් සිටුවීම, ජල පෝෂක ප්‍රදේශ ආරක්ෂා කිරීම, වන වගාව, වැසි ජල ටැංකි භාවිතය (ලකුණු 2×6=12)

(02)
(1) ආරක්ෂාවට ඇති අයිතිය, සහභාගීත්වයට ඇති අයිතිය, සංවර්ධනයට ඇති අයිතිය, පැවැත්මට ඇති අයිතිය(මින් දෙකක්)
(2) ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී, ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරී, මුල් ළමාවිය සංවර්ධන නිලධාරී, සමාජ සේවා නිලධාරී ආදී
(3) (a) අධ්‍යාපනය ලැබීම, සෞඛ්‍ය පහසුකම් ලැබීම, නිසි රැකවරණය ලැබීම, මිතුරු සබඳතා පැවැත්වීම
(b) සිසු පිළිතුරු අනුව යුතුකම් සඳහා ලකුණු ලබා දෙන්න.

(03)
(1) සියලුම පුරවැසියන්ට පොදුවේ ප්‍රයෝජනයට ගතහැකි වීම, මහජන සුභ සිද්ධිය අරමුණු කරගෙන පවත්වා ගෙනයාම, පුද්ගල සංවර්ධනය තුලින් සමාජ සංවර්ධනයට දායක වීම, පවත්වා ගෙන යාමට හා ආරක්ෂා කිරීමට නීති පද්ධතියක් පැවතීම ආදිය
(2) නව දැනුම ලබාදීම, සමාජානුයෝජනය කිරීම, යහපත් පුරවැසියන් බිහි කිරීම, ජාතික සමගිය පෝෂණය කිරීම
(3) (a) විදුලිය , සෞඛ්‍ය , ප්‍රවාහනය.... ආදිය
(b) සිසුන් ලියා ඇති සේවාවට අදාල යුතුකම් දෙකක්වත් දක්වා තිබීම (9 ශ්‍රේණිය පෙළපොත 30,32 පිටු)

(04) (1) ශ්‍රී ලංකාව, ඉන්දියාව, ඇමරිකා එක්සත් ජනපදය, සිංගප්පූරුව, මහා බ්‍රිතාන්‍ය

(2) විවිධ ජන වර්ග ජීවත් වීම, විවිධ ආගම් පැවතීම, විවිධ භාෂා කතා කරන ජනතාව ජීවත්වීම, විවිධ සිරිත් විරිත්, සංස්කෘතික උරුම පැවතීම ආදිය

(3) අන් සංස්කෘතීන්ට ගරු කිරීම, සෑම ජන වර්ගයකම අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, අන් අයගේ මතවාද, අදහස් ඉදිරිපත් කිරීමට ඇති අයිතිය පිළිගැනීම හා ඒවාට ගරු කිරීම ආදිය

(05) (1) සුනාමි , භූමිකම්පා , භූ චලන

(2) වනාන්තර විනාශ කිරීම, වගුරු බිම් ගොඩ කිරීම, පතල් කැණීම, ගංගාවල වැලි ගොඩ දැමීම, ගං ඉවුරුවල අනවශ්‍ය ඉදිකිරීම්, දිරාපත් නොවන අපද්‍රව්‍ය අනිසි ලෙස බැහැර කිරීම

(3) කැලෑ ගිනි නොතැබීම, කඩොලාන ආරක්ෂා කිරීම, වෙරළ තීරයේ වැලි වැටි සුරැකීම, කඩොලාන ශාක ආරක්ෂා කිරීම, වනාන්තර විනාශ නොකිරීම, අපද්‍රව්‍ය අනිසි ලෙස බැහැර කිරීමෙන් වැළකීම, කොරල්පර කැඩීමෙන් වැළකීම, වෙරළබඩ හා කඳුකර ප්‍රදේශවල අනවසර ඉදිකිරීම් නොකිරීම ආදිය

(06) (1) සංවේදී බව, සමාජශීලී බව, වෙලාවට වැඩ කිරීම, නිර්මාණාත්මක බව, කාර්යක්ෂම බව, පිළිවෙලට වැඩ කිරීම

(2) කායික ශ්‍රමය , මානසික ශ්‍රමය

(3) සේවාදායකයාට - රැකියාව පිළිබඳ අභිමානයක් ඇතිවීම, සේවාව පිළිබඳ තෘප්තිමත් බව හා සතුටක් ඇතිවීම, ආයතනය කෙරෙහි ඇල්මක් ඇතිවීම, කාර්යය ඉහළින්ම ඉටු කිරීමට පෙළඹීම

සේවාලාභියාට - අවශ්‍යතා පහසුවෙන් ඉටු කරගත හැකිවීම, සමාජීය කාර්යක්ෂමතාව ඇතිවීම, චිත්තවේග සමබරතාවය ඇතිවීම, ආයතනය කෙරෙහි හිතවත්බවක් ඇතිවීම, විශ්වාසනීයත්වය ගොඩ නැගීම

(07) (1) මාර්ග සංඥා හා නීති පිළිබඳ සැලකිලිමත් නොවීම, දකුණු පසින් ගමන් නොකිරීම, ජංගම දුරකථන භාවිත කරමින් ගමන් කිරීම, පදික මාරු භාවිත නොකිරීම, කණ්ඩායම් වශයෙන් ගමන් කිරීම ආදී

(2) මාර්ග නීති නිසි පරිදි ක්‍රියාත්මක කිරීම, මාර්ග සංඥා පිළිපැදීම, බීමත්ව රිය පැදවීමෙන් වැළකීම, අයහපත් කාලගුණ තත්වවලදී ප්‍රවේශමෙන් රිය පැදවීම, ආරක්ෂිත පටි පැළඳීම ආදිය

(3) ප්‍රචණ්ඩකාරී ක්‍රියා සිදුවීමට ඇති ඉඩකඩ වැළැක්වීම, ඉක්මනින්ම තුවාල ලත් අය රෝහල වෙත ගෙනයාම, පොලීසිය දැනුම්වත් කිරීම, විපතට පත් අයගේ මුදල්,භාණ්ඩ ආරක්ෂක අංශ වෙත හෝ හිමිකරුට ලබාදීමට කටයුතු කිරීම ආදිය

ලකුණු I කොටස =40

II කොටස =12×6=60

මුළු ලකුණු 100